# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2022 සැප්තැම්බර්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2022 සැප්තැම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 73.7%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2022 අගෝස්තු මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 70.2%ක් ලෙස වාර්තා විය. 2022 සැප්තැම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 40.9%ක හා ආහාර නොවන කාණ්ඩයේ 32.9%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2021 සැප්තැම්බර් මාසයේ 6.2%ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 4.6%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 1.6%ක් විය. 2021 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව 2022 සැප්තැම්බර් මාසයේ උද්ධමනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර හා ආහාර නොවන කාණ්ඩවල පැවති ඉහළ මිල මට්ටම් ය. ඒ අනුව, ආහාර කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය) 2022 අගෝස්තු මාසයේදී 84.6% සිට 2022 සැප්තැම්බර් මාසයේදී 85.8% දක්වා වැඩි වූ අතර, ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය) 2022 අගෝස්තු මාසයේදී 57.1% සිට 2022 සැප්තැම්බර් මාසයේදී 62.8% දක්වා වැඩි විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2022 අගෝස්තු මාසයේ 250.4ක් වූ දර්ශකාංකය 2022 සැප්තැම්බර් මාසයේ 256.2ක් දක්වා වැඩිවීමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2022 සැප්තැම්බර් මාසයේ දර්ශකාංකය 5.8ක වැඩිවීමක් එනම් 2.3%ක ප්‍රතිශතාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 0.38%කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 1.96%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට පළතුරු, තිරිඟුපිටි, කුකුළුමස්, අර්තාපල්, තේ කොළ, කරවල, පාන්, ළදරු කිරිපිටි, හාල්පිටි, අළුත් මාළු, රතුළූණු, ටින්මාළු, නූඩ්ල්ස්, හරක්මස් සහ ලූණු යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත. තවද හාල්, සීනි, මයිසූර් පරිප්පු, බිත්තර, පොල්තෙල්, අමුමිරිස්, පොල්,එළවළු, ලොකුළූණු, බිස්කට් වර්ග සහ වියළි මිරිස් යන ආහාර ද්‍රව්‍ය වල මිලෙහි අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2022 සැප්තැම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (*දුම්වැටි*), ‘රෙදිපිළි හා පාවහන්', 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' (*විදුලි බිල, ජල බිල හා භූමිතෙල්*), 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' (*සබන් වර්ග*), 'සෞඛ්‍ය' (*ඖෂධ නිෂ්පාදන මිලදී ගැනීම හා පෞද්ගලික රෝහල් ගාස්තු*), ‘ප්‍රවාහන' (*වාහන සේවා ගාස්තු*), 'සන්නිවේදන' (*ජංගම දුරකථන ගාස්තු හා ස්ථාවර දුරකථන ගාස්තු*), 'විනෝදාත්මක හා සංස්කෘතික', ‘අධ්‍යාපන' (*ජාත්‍යන්තර පාසල් ගාස්තු*), 'ආපනශාලා සහ හෝටල්' සහ ‘විවිධ භාණ්ඩ හා සේවා' (*සුවඳ සබන් වර්ග*) යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2022 අගෝස්තු මාසයේ 60.5% සිට 2022 සැප්තැම්බර් මාසයේ 64.1% දක්වා වැඩිවීමක් වාර්තා විය.




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| 2021 | සැප්. | 147.5 | 159.6 | 137.9 | 147.2 | 0.3 | 0.5 | 6.2 | 10.0 | 3.0 | 4.8 |
| | ඔක්. | 150.6 | 162.6 | 141.2 | 150.6 | 2.1 | 2.3 | 8.3 | 11.7 | 5.4 | 7.2 |
| | නොවැ. | 155.3 | 171.5 | 142.6 | 153.0 | 3.1 | 1.6 | 11.1 | 16.9 | 6.2 | 8.8 |
| | දෙසැ. | 161.0 | 182.1 | 144.5 | 155.7 | 3.7 | 1.8 | 14.0 | 21.5 | 7.6 | 10.8 |
| 2022 | ජන. | 166.0 | 188.3 | 148.4 | 159.2 | 3.1 | 2.2 | 16.8 | 24.4 | 10.2 | 12.9 |
| | පෙබ. | 167.8 | 190.6 | 149.8 | 161.2 | 1.1 | 1.3 | 17.5 | 24.7 | 11.0 | 14.1 |
| | මාර්තු | 172.7 | 195.2 | 154.9 | 166.3 | 2.9 | 3.2 | 21.5 | 29.5 | 14.5 | 17.3 |
| | අප්‍රේල් | 190.3 | 218.8 | 167.9 | 182.3 | 10.2 | 9.6 | 33.8 | 45.1 | 23.9 | 27.9 |
| | මැයි | 208.7 | 242.2 | 182.4 | 197.9 | 9.7 | 8.6 | 45.3 | 58.0 | 34.2 | 37.7 |
| | ජූනි | 231.5 | 276.6 | 196.0 | 215.9 | 10.9 | 9.1 | 58.9 | 75.8 | 43.6 | 49.3 |
| | ජූලි | 244.4 | 289.3 | 209.1 | 229.0 | 5.6 | 6.1 | 66.7 | 82.5 | 52.4 | 57.3 |
| | අගෝ. | 250.4 | 294.3 | 215.8 | 235.1 | 2.5 | 2.7 | 70.2 | 84.6 | 57.1 | 60.5 |
| | සැප්. | 256.2 | 296.5 | 224.5 | 241.5 | 2.3 | 2.7 | 73.7 | 85.8 | 62.8 | 64.1 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව